# Living the LOTUS

Buddhism in Everyday Life

6
2020
VOL. 177

## Founder's Essay

### යටහත් පහත් බවින් නැගී සිටිමු

බුදුන් වහන්සේ විසින් ගිහි හෝ පැවිදි ඕනෑම කෙනෙක් විමසු ප්‍රශ්න වලදී, 'සාදු සාදු විශිෂ්ඨ ප්‍රශ්නයක් ඇසුවා' යැයි ප්‍රශංසා කරමින්, අදල පුද්ගලයන් සෑහීමකට පත්වන තෙක්ම පිලිතුරු ලබා දුන්හ. කිසිම විටෙක 'ඔය කරුණවත් දන්නේ නැතිද' යන ලෙසින් ශ්‍රාවකයන්ව පහත්කොට සැලකුවේ නැත. එමනිසා බුදුන් වහන්සේව බැහැ දැකීමෙන් හෝ කට හඬ ඇසීමෙන් හදවත ආලෝකමත් වු බව පැවසේ.

එසේම, ධර්ම ශාඛාවේ නායකයන් ලෙස පත් වන පුද්ගලයන් තුල, එම නායකත්වය තුලින් විශිෂ්ඨ ලෙස තමාගේ දියුණුවක් ඇති කර ගන්නා පුද්ගලයන් සිටිනවා වාගේම, එසේ නොවන අයද සිටියි. ඒ වෙනස තිබෙන්නේ, මම හැම දෙයම දන්නා නිසා අනික් අයට කියාදෙන්න ඕනේ යන හැගීමෙන් තමා සිටිනවාද, එසේ නොමැතිව හැම සාමාජිකයෙක්ගෙන්ම ඉගෙන ගත යුතුයි යන හැගිමෙන් සිටිනවාද යන කරුණු දෙක අතරයි. තමන් කියන හැම දෙයම 'හරි හරි' ලෙස පිලිගන්නා පුද්ගලයන් සිටින විට, එය ජයග්‍රණයක් යැයි සිතා, තමා නොදැනුවත්වම මමත්වය ඉස්මතු වේ.

අප සංවිධානයේ කුමන හෝ වගකීමක් දරන නායකයන් යනු, අන්‍යයන්ගේ බුද්ධ ශක්තියට ගෞරව කරන අය වේ. හදිසියේවත් 'මේ දෙය කී පාරක් කිව්වොත්ද තේරෙන්නේ' ආදී සාමාජිකයන්ව පහත්කොට සළකන සිතුවිලි ඇති වන්නේ නම්, ඒ ඔබගේ අහංකාරත්වය ඉස්මතු වී ඇති බවට සාක්ෂිය වේ. මන්ද සාමාජිකයන්ගේ පිහිටෙන්, බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් සේ සිතීමට හැකි නම්, එය යටහත් පහත්බව වේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 9, P. 186-187

Living the Lotus
Vol. 177 (June 2020)

Senior Editor: Koichi Saito
Editor: Kensuke Osada
Copy Editor: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by
Rissho Kosei-kai International,
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email:
living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදි. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදිත්, සමාජයේදිත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදි නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# උදාසීන හදවතට පරාජය නොවී




**නිචිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**


## අධ්‍යාත්මික දියුණුව වැදගත් යැයි දැනගෙන සිටියත්

ජපානයේ ප්‍රකට කවියක 'දැන සිටියත්, නවත්වා ගැනීමට නොහැකියි නේ' සේ පදයක් තිබේ. විනෝදස්වාදය දනවන ආකාරයට එම පද පෙලි අමුණා ඇතත්, අපගේ හදවතට දැනෙන සිතුවිලි එයින් මනාව පෙන්වා ඇත.

එහි සදහන් ආකාරයට අප, කළ යුතු දේ මගහරින අවස්ථා හා නොකළ යුතු දේ කරන විට 'දැනගෙන සිටිය වුනත්' මේ දෙය කලානේ සේ හැගෙන වාර ගණනේ අඩුවක් නැතැයි සිතමි.

බුදු දහමේද 'නිරන්තරයෙන් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනිම' වැදගත් යැයි කියා දෙයි. කොම්පියුසස් වාදයේ හා පුරාණ දර්ශන වලද නිරන්තර ඉගෙනීම තුලින් තම ශරිරයට ධර්මය බද්ධ කර ගැනීම වැදගත් බව කියා දෙයි. මන්දයත්, මනුෂ්‍යයන්ගේ හදවතේ දියුණුව 'මෙතැනින් අවසන්' යැයි සීමාවක් නොමැති නිසාය.

අපි සාමාන්‍යයෙන් බුද්ධ මාර්ගයට එහා දෙයක් නැතැයි සිතමි. නමුත් එහි අරුථ 'ධර්මාවබෝධය ලබා ගත්තා යැයි සිතුවත්, එය අවසානය නොවේ. ප්‍රඥුව වඩවා ගැනීමේ හැකියාව අසීමිතයි' සේ භාර ගන්නේ නම් ඒ තුලින් අපගේ දියුණුවට උත්තේජනයක් ලබාදෙයි.

ඒ නිසා නිතරම ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම ඉතා වැදගත්ය. නමුත් අපි සැනෙකින් 'ටිකක් කම්මැලි වුනාට කමක් නැහැ' යන හැගීමට පරාජය වේ.

'මිදී තීන මිදු බවෙන් - මිදී හැම සිත් කළබලයෙන්, රෑ දිවා මහ කරුණාවෙන් - දෙසති සදහම් නිරන්තරයෙන්' ලෙසින් සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ සුඛ විහාර නම් 14 වන පරිච්ඡේදයේ සදහන් වේ. හැම කෙනෙක්ම තීන මිත්‍යාවෙන් හා කම්මැලි කමින් කාලය ගත කරන බව බුදුන් වහන්සේද අවබෝධ කරගෙන සිටියා විය හැකිය. ඒ අනුව 'හද පත්ලෙන්ම නැගෙන වැරදි ක්‍රියාවන්ට හා මංමුලාවීම් වලට යටත් නොවී, තමා විසින්ම සැහැල්ලුවෙන් සතුටෙන් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගන්නේ කෙසේද' යන කරුණ ගැනයි මේ පරිච්ඡේදය තුලින් බුදුන් වහන්සේ අපට කියා දෙන්නේ.

## බලාපොරොත්තුවෙන් පිරිසක් සිටින නිසා

'ඉගෙන ගනිමින්, ඉඩ ඇති වෙලාවට පුණරික්ෂන කරමි. එයට වඩා සතුටක් නොමැත' ලෙස කන්ෆුයිසින් වාදයේ ප්‍රසිද්ධ වදනක් ඇත.

කුඩා දරුවන් වැඩිහිටියන් දෙස බලා, අර වගේ වෙන්න ඕනේ යනුවෙන් සිතමින් අරමුණක් ඇතිව නැවත නැවත පුණරික්ෂන කිරිම හැර වෙන සතුටක් නොමැත යන්න එහි අරුථයි.

එය ආගමික ලෝකයට බද්ධ වේ. 'නිතරම සිනහා මුසු මුහුණින් සිටිමු', 'කෘතවේදීත්වය අමතක නොකරමි'.... ආදි ලෙසින් එදිනෙදා ජීවිතයේ අරමුණ හා ඒ වෙනුවෙන් කුමක් කළ යුතුද යන්න ධාරණය කර ගන්නේ නම්, තව ඉතිරිව තිබෙන්නේ ඒ වෙනුවෙන් නැවත නැවත කරන්නාවු පුහුණුව වේ. එය 'පුරුද්දක්' බවට පත් වීමෙන් ඇති වන්නා වු සතුට තවත් වැඩිවේ.

එසේම, ආගමික ජීවිතයක් ගත කරන්නේ මන්ද, කුමක් සදහා ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගත යුතුද, ලෙසින් තම අරමුණ හා ඒ වෙනුවෙන් කළ යුතු දෑ නියමාකාරයෙන් අවබෝධ කර ගැනීමෙන් සතුට ඇතිවෙනවා වාගේම ආධ්‍යාත්මික දියුණුවටත් පදනම් වේ.

එය දැනගෙන සිටියත් තම හදවතේ සිතුවිලි වලට පරාජය වීම, මනුෂ්‍යයන්ගේ සිරිතයි. හදවතට සැහැල්ලුවක් අවශ්‍ය බැවින් ටිකෙන් එසේ වුවත් කම් නැත. නමුත් ඒ අවස්ථාවලදී තම අරමුණ අමතක නොකල යුතුය.

උදහරණක් ලෙස, සූත්‍ර සජ්ඣායනය වුවත්, සාමාජික සාමාජිකාවන් එක් කරගෙන කිරිමයි සාමාන්‍ය ආකාරය වන්නේ. නමුත් මෙවැනි අවස්ථාවලදී අපහසුවෙන් කටයුතු කිරීම නොකල යුතුය. අසනීපයක් හැදුන විට, කාර්ය බහුලත්වයත් සමග මහන්සිය ඇති වු විට විවේක ගත්තාට කමක් නැත. ආධ්‍යාත්මික දියුණුව ඇති කරගත යුතු යැයි සිතා අපහසුතාවයෙන් කටයුතු නොකළ යුතුය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සුඛ විහාර නම් 14 වන පරිච්ඡේදයේම, 'කිසිවෙකුත් නොසළකා හරිමින්, සැලකිය යුතුය සම කරුණාවෙන්' සේ සදහන්ව ඇත. අන්‍යයන් ගැන සිතනා හැඟීමක් ඇති විට, වෙහෙසක් දැනෙන්නේ හෝ කම්මැලි කමක් ඇතිවන්නේ නැත.

ඒ තම දරුවන් වෙනුවෙන් වෙහෙස නොබලා කටයුතු කරන මවක් හා සමානයි. 'තමාව බලාපොරොත්තුවෙන් පිරිසක් සිටින නිසා' යන හැඟීම ඇති වන විට, තමා ආත්මාර්ථකාමිත්වයෙන් ඈත් වී, අන්‍යයන්ට ප්‍රයෝජනවත් දෙයක් කරන්න ඕනේ යන හැඟීම තුලින් ඇති වන ආධ්‍යාත්මික දියුණුවේ එකින් එක සතුට හා සැහැල්ලුව බවට පත්වේ.

මේ අවස්ථාවේ ජපානය පමණක් නොව, මුළු ලෝකයම ව්‍යසනයකට මුහුණ දී සිටියි. 'දිවා රෑ මහා කරුණාවෙන් දහම් දෙසිය යුතුයි' සේ සදහන් ආකාරයට, ඔබ දෙසනා එම දහම ඇසීමට බලාපොරොත්තුවෙන් පිරිසක් නොසිටියිද?

From *Kosei*, June 2020

# එකම අධිෂ්ඨානයකින්

යොෂියෙ චෙන්
තායිවාන උතුරු ධර්ම ශාඛාව

මෙම සෙප්පෝව 2020 වර්ෂයේ පෙබරවාරි මස 4 වන ගොමෙයිනිචි දිනයේදී තායිවාන උතුරු ධර්ම ශාඛාවේදී පවත්වන ලද්දකි.

2019 වන වර්ෂයේ 12 වන මස 9 වන දින, විශාල පිරිසකගේ උදව් උපකාරය ඇතිව මම වර්තමානයේ ජීවත්වන වියට්නාමයේදී, විශාල පිරිසකගේ ආශිර්වාදයෙන් බුදු පිළිම වහන්සේ තැන්පත් කිරීමට හැකියාව ලැබුනා. එම ස්තුතිවන්ත හැඟීමද සිතේ තබාගෙන අද දින වන තෙක් මාගේ ජීවිතය ගැන පසු විපරම් කිරීමට බලාපොරොත්තු වනවා. සියළු දෙනාගෙන්ම අවසරයි.

කරුණාවන්ත පියෙකුගේ සහ ආලෝකමත් ජීවිතයක් තිබෙන මවගේ, දරුවන් 4 දෙනාගෙන් බාලම දරුවා ලෙස ජපානයේ ගිෆු ප්‍රාන්තයේදී මම උපත ලැබුවා. මාගේ ආච්චීගේ (තාත්තාගේ මව) සිට රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට බැඳී කටයුතු කල නිසා මම 3 වන පරම්පරාවයි.

මම අම්මාගේ බඩේ සිටින කාලයේ පටන්ම ධර්ම ශාඛාවට යමින්, ඊට පසුව මූලික පාසල් අවදියේදී ධර්ම ශාඛාවේ 'නැටුම් කණ්ඩායමේ' සහ 'පිරිසිදු සේවා', 'මුලස්ථාන වන්දනා කිරීම' වැනි දේටත් සහභාගී වෙමින්, මැදි විදුහලට ඇතුලත් වී ශිෂ්‍ය සංගමයේ 'සම්මන්ත්‍රණ' වලට සහභාගි වෙමින්, විශ්ව විද්‍යාල අවදියේදී නගොයා ධර්ම ශාඛාවේ පැවැත්වූ 'විශ්ව විද්‍යාල සිසුන් සඳහා සම්මන්ත්‍රණ' සහ 'ගිෆු නොබුනගා' උත්සවයේ මතොයි කැරකවීම වැනි, මාව කැඳවූ සෑම දෙයකටම සහභාගි වුනා. එහෙත්, ගොඩක් අය ධර්ම ශාඛාව ගැන ඉතාමත් විශ්වාසයෙන් සිටියත්, මම කෝසෙයි කායි සංවිධානයේ සාමාජිකයෙකු වීම ගැන ලැජ්ජාවකින්, යහළුවෙකුට පවා එය කීමට නොහැකිව, කාටවත්ම එය කීමට නොහැකිව එය සඟවා ගෙන සිටියා.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව හෝටලයේ රැකියාවට ගිය මට පැවරී තිබුනේ ආගන්තුකයන්ට සත්කාර කිරීමයි. එයට මම කැමති නිසා එය මට හොඳ රැකියාවක් විය. මිනිස්සුන්ව සතුටට පත් කිරීමට හැකිවීම පිළිබඳ ඉතාමත් සතුටින්, තව තවත් උනන්දුවෙන් වැඩකිරීමට සිතුවා. කෙසේ වෙතත්, එයින් ලැබෙන සතුට තාවකාලික වී, මම 'මාගේ ජීවිතය මේ ආකාරයට ගෙන ගියොත් හොඳයිද' යැයි මාගෙන්ම ප්‍රශ්ණ කලා.

දවසක්, ගෙදර තිබුනද කිසිද කියවා නොතිබූ කෝසෙයි පත්තරය ඇස් ඉදිරියේ දිස්වුනා. එය නික්යෝ නිවානෝ තුමාගේ අවමංගල්‍ය දිනයේ නික්යෝ නිවානෝ තුමාගේ පිංතූර රාශියක් දැක, මෙවන් විශාල පිරිසකගේ ආදර ගෞරවයට පාත්‍ර ව සිටින නික්යෝ නිවානෝ තුමා, මොන තරම් විශිෂ්ඨ ජීවිතයක් ගත කරන්නට ඇතිද යැයි සිතුවා. ඉන්පසු මමත් ඒ ආකාරයටම විශිෂ්ඨ ජීවිතයක් ගත කරන්නට ඕනා යැයි තදින්ම සිතාගත්තා. මම ඉංග්‍රීසි භාෂාවට සහ කුඩා දරුවනට කැමැත්තක් දැක්වූ නිසා, ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස දරුවන්ගේ ආනාගතය ගොඩනැගීමට සිතා ඉංග්‍රීසි භාෂාව වැඩිදියුණු කර ගැනීමට සිතා වැඩිදුර අධ්‍යාපනයට එංගලන්තයට යාමට තීරණය කලා. නික්යො නිවානෝ තුමා මාගේ උරහිසට අත තබා 'ගිහින් එන්න' යැයි කිව්වාසේ මට දැනුනා.

එංගලන්තයේදී ගොඩක්දේ ඉගෙනගත්තා. ඉගෙන ගත් වැදගත්ම දෙය නම් ආගමක් ඇදහීමේ වැදගත්කම වටහා ගැනීමයි. ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට විවිධ රටවලින් විශාල පිරිසක් එංගලන්තයට පැමිණෙනවා. විවිධ පසු බිමක් ඇති අය ආශ්‍රය කිරීම තුළින් මට ආකර්ශණීය හැඟීමක් දැනුනේ, ආගමක් අදහන අයගේ පොදු සාධකය නම් උණුසුම් අදහස් ඇති හදවතක් සහ විශාල පෞරුෂයක් තිබීමයි. තව දුරටත්, තුර්කි ජාතිකයෙකු වන ඉස්ලාම් ආගම අදහන කාන්තාවකගෙන්, බුදු දහමේ විශිෂ්ඨතාවය ඉගෙන ගත්තා. ඇය පැහැදී සිටියේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයට බව මම පසුව තේරුම් ගත්තා.

ජපානයට නැවත් පැමිණි මම, බුදු දහම ඉගෙන් ගන්න ඕනා, ඒ වාගේම කෝසෙයි කායි ඉගැන්වීම්ද ඉගෙන ගන්න ඕනා යන හැඟීමෙන් සිටියා. එතෙක් උදාසීනව තිබූ මගේ විශ්වාසය, හදවතින්ම දහම අවබෝධ කරගන්න ඕනා යන ප්‍රායෝගික ධර්ම පුහුණුවකට වෙනස් වුනා. ඉන් පසු තරුණ කණ්ඩායමේ වැඩසටහන් වලට ක්‍රියාකාරීව සහභාගි වෙමින්




තායිවාන උතුරු ශාඛාවේදී සෙප්පෝව ඉදිරිපත් කරන චෙන් මහත්මිය

බුදු දහම ඉගෙන ගනිමින්, තරුණ කණ්ඩායම සමඟ ධර්ම ව්‍යාපත කටයුතු සිදු කිරීමට ලැබීම ඉමහත් සතුටක් බවට පත්විය.

මේ ආකාරයට ක්‍රියාශීලිව වැඩකරමින් අවුරුදු එකහමාරක් වැනි කෙටි කලකින් තරුණ කණ්ඩායමේ නායකත්වයට පත්විය. ධර්ම ශාඛාවේ කටයුතු සහ වැඩසටහන් සඳහා කුමක් කලහොත් වැඩි පිරිසක් සහභාගි කරගැනීමට හැකි වේවිද යන්න සිතමින්, සෑම දිනකම වාගේ ධර්ම ශාඛාවට ගියා. ඉතා උනන්දුවෙන් පැවරී තිබූ රාජකාරි කිරීම තුලින් තමන්ගේ ශක්තියට වඩා වෙනත් ශක්තියක් ඇති බව දැනෙන්නට වුනා. එම කාලයේ බුදු දහම ගැන ගැඹුරු අවබෝධයක් නොමැතිව, රිෂ්ෂෝ කෝසෙයි කායි ඉගැන්වීම් ගැන හරි ආකාරව හැඳින්වීමට නොහැකි මම, ඉතා උනන්දුවෙන් කෝසෙයි කායි ඉගැන්වීම තුළින් ජීවිතය ගත කරමින්, වැඩසටහන් වලට සහභාගි වීම තුළින් බුද්ධ, ධම්ම, සංඝ යන තිසරණය ජීවිතයට බද්ධ කරගනිමින්, මේ ලෝකය තුල 'සත්‍යය' පවතින බවත් බුදුන් වහන්සේ අපව ආරක්ෂා කරන බවත් අවබෝධ කරගත්තා.

එය ප්‍රීතිමත් ජීවිතයක යතුර අතට ලැබුනා වැනි හැඟීමකි. එය අවබෝධ කරගත් නිසා, කොපමණ දුකක් වුවද තමන්ගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍ය ''බුදුන් වහන්සේ ගෙන් ලැබුන තෑග්ගක්'' යැයි සිතීමට පටන් ගත්තා. කොතනක සිටියත්, කාත් සමඟ සිටියත්, ඕනාම කෙනෙකු සමඟ අමනාප නොවී, ශක්තිමත්ව, ධනාත්මකව ජීවත් වීමට හැකිවේ.

ඉන් පසු මම අධ්‍යාපනය ලබන කාලයේදී මුනගැසුනු තායිවාන් ජාතික වර්ථමානයේ මාගේ සැමියා වී සිටින ඔහු සමග විවාහ වී තායිවානයට ගොස් ජීවත්වීමට පටන්ගත්තා. තායිවානයේත් රිෂ්ෂෝ කෝසෙයි කායි ධර්ම ශාඛාවක් තිබෙන නිසා එය මාගේ දෙමව්පියන්ට ඉමහත් අස්වැසිල්ලක් වුනා. මින් පෙර තරුණ ක්‍රියාකාරකම් වලින් ඉගෙනගත් දේ, ධර්ම ශාඛාව වෙනුවෙන් ජීවිතය කැපකර කටයුතු කරන විට, මාගේ ජීවිතයද ඉබේම සාර්ථක ජීවිතයකට වෙනස් වුනා. එය මම ලැබූ අශිර්වාදයක් බව සිතූ මම තායිවානයේදීත් හැකි සෑම විටම ධර්ම ශාඛාවට යාම සිදුකලා.

තායිවානයේ ජීවත් වීමට පටන් ගැනීමත් සමඟ භාෂාව නොදන්නා නිසා එන ප්‍රශ්න වලටද මුහුණ දෙමින්, දරු ප්‍රසූතිය, දරුවන් හදවඩා ගැනීම වැනි විශාල අත්දැකීම් රාශියකට මුහුණදුන්නා. ඒ වාගෙම ධර්ම ශඛාව කිට්ටුව පිහිටා තිබූ නිසා, ධර්ම ශාඛාවට යාම, තෝබන් සිදුකිරිම, දනය දීම වැනි දේ කිරීමට හැකිවී සාමාජිකයන්ගේ උණුසුම් හැඟිමත් සමඟ, කනස්සල්ලක් නොමැතිව ජීවිතය ගෙන යාමට හැකිවුනා. තායිවානයට පැමිණීමෙන් පසු සැමියාගේ දෙමව්පියන් සමඟ එකට ජීවත් වුනත්, කෝසෙයි කායි ඉගැන්වීම් තුලින්, තරුණ කාලයේ සිටම ''දෙමව්පියන්ට සැළකීම'', ''මුතුන් මිත්තන්ට පිං අනුමෝදන් කිරීම'', ''බෝධිසත්ව චර්යයාවේ යෙදීම'' වැනි දේ වල වටිනාකම ගැන හොඳින් දැන සිටි නිසා, එකට ජීවත් වන දෙමව්පියන්ට සැළකීමට අවස්ථා රාශියක් තිබේ යැයි සිතමින්, දෙමව්පියන් සමඟ ස්තුතිවන්තව කටයුතු කිරීමට හැකියාව ලැබුනා.

මේ කාලයේදී තායිවාන උතුරු ධර්ම ශාඛාවේත් වෙනස් වීමක් සිදුවුනා. ජපන් භාෂාව චතුර ලෙස කතාකිරීමට හැකි චිඑන් රූ ලිආන් කියෝකයිචෝ සාන් විසින් ඔහුගේ දුව වන චිඑන් මීආඔ ෆැන්ග් වර්තමාන කියොකයිචෝ ලෙස පත් කරනු ලැබුවා.

ජපන් භාෂාව තේරුම් ගැනීමේ කෙනෙකුගේ සිට ජපන් භාෂාව නොතේරෙන කෙනෙකුට තනතුර මාරු වීම විශාල වෙනසක් වුනා. ජපන් භාෂාවෙන් ලියා තිබෙන ධර්ම පණිවුඩ වල තේරුම එක විටම පරිවර්ථනය කර සාමාජිකයන්ට කියාදීමට නොහැකි කන් කියොකයිචෝ සාන්ගේ දුක, තේරුම් ගැනීමට හැකිවුනා. ටිකක් හෝ භාෂා ප්‍රශ්ණය විසඳ ගැනීමට, මට ලේඛන කළමනාකාර තනතුර ලැබී, මමත් පුළුවන් උපරිමෙන් එම සේවය සිදුකලා. නමුත් ඒ අතර තුර සැමියාගේ රාජකාරි කටයුතු සඳහා, දරුවන් තුදෙනාත් සමඟ වියට්නාමයට යාමට සිඳුවුනා.

ධර්ම ශාඛාවක් නොමැතිව සාමාජිකයන්ද නොමැති වියට්නාමයේදී මට තිබූ එකම සහාය වූයේ උදේ සවස සූත්‍ර සජ්ජායනයයි. සූත්‍ර සජ්ජායනා කරමින් බුදුන් වහන්සේ මූලික කරගෙන ජීවත්විම තුලින්, හදවත ප්‍රාණවත්වී, සෑම දිනකම ධනාත්මකව කටයුතු කිරීමට හැකිවුනා. තවද තායිවාන උතුරු ධර්ම ශාඛාවට අවශ්‍ය දෙයක් තිබේනම් වියට්නාමයේ සිටියත් එය ඉටුකරදෙනවා යැයි සිතා සිටියා.

එසේ සිටින විට වියට්නාමයට පැමිණ වසර හයක් ගත්වූ 2019 වර්ෂයේදී, කන් කොයොකයිචෝ සාන්ගේ විසින් අප සංවිධානයේ බුදු පිළිම වහන්සේ ලබාදීමට මාව තෝරාගෙන ඇති බව පැවසුවා. එය විශාල සතුටක් වුනත් ඇයි මේ කාලයේදීම, යැයි හැඟිමකුත් සිතේ තුබුනා. මොකද මෙම වර්ෂයේ 9 වන මස, සැමියාගේ රැකියා ස්ථානයේ වසර 17 ක සේවා කාලයක් සහිත සේවකයෙකු විශ්‍රාම යන නිසා, චීන භාෂාවද හරි ආකාරව නොදත් මම එම සේවකයා වෙනුවට රැකියාව කිරීමට පටන්ගත් නිසාය. මීට අවුරුදු 3 කට පමන පෙර සිට සැමියාගේ රාජකාරි කටයුතු වලට උදව් කලත්, සෑම දිනකම හිස ගිනි ගන්නවා වැනි කාර්යබහුල ගතියක් තිබුනා. කියොකයිචෝ සාන් විසින් ''බුදු පිළිම වහන්සේ ලබාගන්න ඕනා'' යන හදවතින් කටයුතු කරනවානම් මර්ගයක් සැකසේවි යැයි උපදෙස් දුන්න. මම බුදු පිළිම වහන්සේ ලබාගන්න ඕනා යන හැඟීමෙන් සිටියත්,

සැමියා ගැන කනස්සල්ලක් තිබුනා. රැකියාව නිසා කාර්යබහුලව සිටින සැමියාට කරදර, දරුවන් තුන් දෙනාගේ කටයුතු භාර කිරීම කරදරයක් යැයි මම සිතුවා. එහෙත් සැමියා එක වචනයකින් ''හා කමක් නැහැ'' යැයි පැවසූවා, සැමියාගේ දෙමව්පියන්ද මාගේ ප්‍රාර්ථනාව වටහාගත්තා.

බුදු පිළිම වහන්සේ තැන්පත් කරන දිනට පෙර දින, කන් කියොකයොචෝ සාන් සහ සාමාජිකයන් 20 දෙනෙකුත් වියට්නාමයට පැමිණියා. හොඳින් බුදු පිළිම වහන්සේ තැන්පත් කිරිමට හැකියාව ලැබීම මාගේ ජීවිතයේ ඉතාමත් වැදගත් අවස්ථාවක් වුනා. බුදු පිළිම වහන්සේ තැන්පත් කිරීමේදී විශාල පිරිසකගේ උණුසුම් කතා බහ අසා හදවත පිරී ඉතිරී ගියා. ''එකම අධිෂ්ඨානයකින්'' මේ වචනය නික්යෝ නිවානෝ තුමාගේ අනුස්මරණය සඳහා ප්‍ර කාශයට පත් කරන ලද ඡායාරූප පොතේ මාතෘකාවට යොදා තිබූ වචනය වුනත්, මම මේ වචනය සිතේ තබාගෙන මේ වනතෙක් ජීවත් වෙමින් පැමිණියා. ආශිර්වාදාත්මක කරුණු අසමින්, මාගේ ජීවිතය ගැන සිතුවා. මට ඉදිරියට රැකියාව, දරුවන් හදාවඩා ගැනීම, ධර්ම ව්‍යාපත කටයුතු මට පැවරී තිබෙන රාජකාරිවේ. එය මට ධර්මය ගැඹුරින් හැදෑරීමට පළමු පියවර ලෙස, මෙවර බුදු පිළිම වහන්සේ තැන්පත් කිරීමට අවස්ථාව හිමිවුනා යැයි සිතනවා.

මාගේ ප්‍ර ාර්ථනය වනුයේ ''තායිවාන් ජාතික මාගේ සැමියාගේ පවුලේ අයට කෝසෙයි කායි ඉගැන්වීම් තව දුරටත් කියා දීම'' යන ප්‍ර ාර්ථනයයි. ඒ වෙනුවෙන් මේ වර්ෂයේ තායිවාන උතුරු ධර්ම ශාඛාවේ සැළසුම් කර තිබෙන මූලස්ථානය වැඳපුද ගැනීමට, සැමියාගේ දෙමව්පියන් සමඟ සහාභාගි වීමට බලාපොරොත්තු වනවා. ඒ වාගේම මාගේ දිගු කාලීන ප්‍ර ාර්ථනය වනුයේ නික්යෝ නිවානෝ තුමා වාගේ සියළු සත්වයන්ගේ සතුට ප්‍ර ාර්ථනා කරමින්, ''එකම අධිෂ්ඨානයකින්'' මේ ඉදිරි ජීවිතය බුදුන් වහන්සේ සමඟ, සියළුදෙනා සමඟ ශක්තිමත්ව බුද්ධ මාර්ගයේ ගමන් කිරීමයි.

අද දින මේ අවස්ථාව ලබාදුන්නට හදවතින්ම ස්තූතිවන්ත වනවා. සියළුදෙනාටම බොහොම ස්තූතියි.



චෙන් මහත්මියගේ නිවසේ බුදු පිළිමය තැන්පත් කිරීමේ උත්සවයේදී

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 16 වන පරිච්ඡේදය, තථාගතයන් වහන්සේගේ සදතන ජීවිතය පිළිබඳ විවරණය
### (පෙර කොටස)

ධර්ම දේශනා වල හරය ප්‍රධාන කොට කියා දෙන 'උපාය කෞශල්‍ය නම් දෙවන පරිච්ඡේදයේදි' 'සෑම සියළු දෙයකම යථාස්වභාවය' ගැන දේශනා කලා. එහි නිගමනය වුවේ, ආරම්භයේ සිට අවසානය තෙක් නොවෙනස් සත්‍ය පරිපූර්ණ බවයි'. එනම් 'අපගේ ඇසට පෙනෙන භෞතික දේවල් නොයෙක් අවස්ථාවල විවිධ ස්වරූපයෙන් යුතු වුවත්, ආරම්භයේ සිට අවසානය දක්වාම එකම පදනමකින් සමානාත්මතාවයෙන් යුතුවේ'. එය ඇඩි දර්ශනික කරුණකි. පහසුවෙන් ධර්මය අවබෝධ කර ගැනීමෙන්, එසැනින් මනුෂ්‍යයන්ව දුකින් මුදවා ගැනීමට නොහැකි ය.

ඒ අනුව බුදුන් වහන්සේ, එම කරුණ මනුෂ්‍යයන්ට සරළව අවබෝධ කරගත හැකි ආකාරයට 'සෑම මනුෂ්‍යයකු තුල බුද්ධ ශක්තිය තිබේ' යනුවෙන් දේශනා කලහ. මුල සිටම එසේ දේශනා කිරීමෙන් සාමාන්‍ය මනුෂ්‍යන්ට අවබෝධ කර ගැනීමට අපහසු වන නිසා උපමා කථා හා ජාතක කථා භාවිතයෙන් මනුෂ්‍යයගේ හදවත ඒ වෙත යොමු කලහ.

### සදතන ජීවිතය පිළිබඳ ප්‍රකාශ කිරීම

මෙම කරුණ ගැන 'තථාගතයන් වහන්සේගේ සදතන ජීවිතය පිළිබඳ විවරණය යන 16 වන පරිච්ඡේදයේදි' පැහැදිලිව සඳහන් වේ. එනම්, බුදුන්ගේ ඇතිවීමක් නෝ නැතිවීමක් නොමැත, එම බුදුන් වහන්සේ සදතනික බුදුන් සේ පවසයි, ශාක්‍යමුණි බුදුන් වහන්සේද සදතනික බුදුන් ලෙස හඳුන්වන බව දේශනා කල වදාලහ. එසේම, මනුෂ්‍යයන්ද එසේ නොවන සෑම ඩෙයමද සදතනික බුදුන් වහන්සේගේ ආශිර්වාදය තුලින් ජීවිතය ලබා සිටින බුදුන් වහන්සේගේ දරුවෝය ලෙස පැහැදිලි කලහ. ඒ තුලින් සෑම දෙයකම යථා ස්වභාවය ගැන අවබෝධ වී, සදතනික බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් තමානට ජීවිතය ගත කිරීමට හැකි වී තිබෙන බව වටහා ගනී. ඒ අනුව නියම සතුට අත්විදීමෙන් ජීවිතයේ වටිනාකම් අවබෝධ වේ.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුල් කොටස වන බුද්ධ දේශනා වලදී දර්ශනිකව සත්‍යාවබෝධය ගැන කියා දෙන අතරම, ධර්මයේ හරය තුලදී මානසික ප්‍රබෝධමත් බවට ඇතිකර ගැනීමට ශක්තිය ලබාදෙයි. මෙම පරිච්ඡේදය, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ පමණක් නොව සියළුම සූත්‍ර වලම හරය ගැබ් වී ඇති බව පවසයි.

මේ සෑම කරුනක්ම සියළුදෙනාට අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා 'ආශ්චර්යමත් වෛද්‍යවරයාගේ උපමා කතාව' මෙහි සඳහන් කර ඇත. එය පාදක කර ගනිමින් මෙම පරිච්ඡේදයේ වැදගත් කරුණු අවබෝධ කර ගනිමු.

### ආශ්චර්යමත් වෛද්‍යවරයාගේ උපමාව

එක් දුරු රටක, පුළුල් දැනුමකින් යුතු වෛද්‍යවරයෙක් සිටියහ. ඕනෑම අසනීපයක් සුව කල හැකි එම වෛද්‍යවරයාට, දරුවන් විශාල ප්‍රමාණයක් සිටියහ. වෛද්‍යවරයා ඉතා දුර රටකට ගොස් සිටිනා වේලාවේදී, දරුවන් වැරදීමකින් වස පානය කලහ. පියා ගෙදර සිටියේ නම් එවැනි දෙයක් නොවන්නට තිබුණා. නමුත් පියා නොසිටි නිසා සිතු මනාපෙට කටයුතු කිරීම නිසා එවැන්නක් සිදුවිය.

විස ශරීරගත වීමෙන් දරුවන් පීඩාවට පත්ව සිටියහ. දරුවන් සමහරක්ට විශාල වශයෙන් වස පෙවී නොතිබුණ අතරම, සමහර අයට සිහියත් නොතිබුණි. එවිට වෛද්‍ය පියා නැවත නිවසට පැමිණියහ. එයින් දරුවන් ඉමහත් සතුටට පත් විය.

දරුවන් සිදුවූ දෙය පියාට පවසමින්, 'තාත්තාගේ පැමිණීම භාග්‍යක්. අපි මෝඩයන් සේ වැරදීමකින් වස පානය කලා. කෙසේ හෝ අපගේ ජීවිත බේරා දෙන්න' යැයි ආයාචනා කලා.



වේදනාවෙන් සිටින දරුවන් දුටු පියා, සැනෙකින් රසවත්, සුවඳවත්, පෙනුමැති බෙහෙත් පියා විසින් දරුවන්ට ලබා දුන්හ. 'මේ ඉතාමත් විශිෂ්ට බෙහෙතක්. මෙම බෙහෙත් බොන්නේ නම්, දැන් තිබෙන වේදනාව සුව වෙනවා පමණක් නොව, ඉදිරියටත් අසනීපයක් නොවී සිටිය හැකිය' ලෙස පැවසූහ.

සිහි කල්පනාව තිබුණ දරුවන් බෙහෙත් පානය කලහ. නමුදු අවාසනාවට , විශාල ලෙස වස පෙවී සිහි කල්පනාව නොමැති දරුවන් 'බෙහෙත් දෙන්න' යයි ආයාචනා කලත්, දුන්න බෙහෙත් කටටවත් ගන්නෙ නැත. මන්දයත්, කල්පනාව නොමැති බැවින් එම බෙහෙත් පාටත් හොද නැති, හොද සුවදකුත් නැතැයි පවසමින් බෙහෙත බොන්නටවත් සිතන්නේ නැත.

පියා බෙහෙත් පානය කරන්නටවත් සිතන්නේ නැති අය දෙස බලා, 'කණගාටුදායකය, වස පානය තුලින් දරුවන්ගේ සත්‍ය ස්වරූපය නැති වි ඇත ' යැයි සිතුහ. වෛද්‍ය පියා, දරුවන් ගැන දරුවන් ගැන අනුකම්පා කර, එක් කෙනෙක් හෝ ඉතිරි නොකර සැවොම දුකින් මුදවා ගන්නා මාර්ගයක් කල්පනා කලහ.

ඉන් පසු දරුවන්ට අනිවාර්යයෙන් බෙහෙත් බොන්න යැයි පවසා නැවත වතාවක් දුරු රටකට ගොස්, 'පියා මිය ගියේ' යැයි පණිවුඩයක් එවීය. එය ඇසූ දරුවන් තිගැස්සීමට පත් වී, 'ආ.... තාත්තා සිටියනම්' සේ දුකට පත් වී අති වු පීඩනයෙන් යථා තත්වයට පමිණියහ.

බෙහෙත් බොනවා හැර වෙන කිරීමට දෙයක් නැතැයි සිතුහ. ඉන් පසු දරුවන් බෙහෙත් බී වස පානයෙන් දැනුනු වේදනාව සමනය කර ගත්හ.

දරුවන් සුව වු බවට තහවුරු කර ගත් පියා , නැවතත් දරුවන් ලගට පැමිණියහ.

## සියළු ක්ලේෂයන්ගේ මූලය වන්නේ

මෙහි සදහන් වෛද්‍ය පියා වන්නේ බුදුන් වහන්සේය, දරුවන් වන්නේ අපිය. වස පානය වන්නේ පංචේන්ද්‍රියන්ගේ ක්ලේෂයන්, බෙහෙත වන්නේ බුඩුන් වහන්සේ දේශනා කළ ධර්මයයි.

සාමාන්‍ය මිනිසුන් වන අප තුල නොයෙකුත් ආශා ක්ලේෂයන් තිබේ. එම ක්ලේෂයන් උපදින ප්‍රධාන මූලය වන්නේ 'ඇසට පෙනෙන භෞතික දේ පමණක් සත්‍යය යැයි සිතිමෙන් ඇතිවන තෘෂ්ණාවේ හදවත' වේ. තම ශරිරය වාගේම, තමා අවට තිබෙන නොයෙකුත් දෑ, රන් රිදී ආදිය සදාකාලික යැයි සිතා තම හදවත පාලනය කරගත නොහැකි වීමෙන් දුක් විදියි.

## හේතුඵල වාදය

මෙහිදි බුදුන් වහන්සේ 'මේ ලොවෙහි තිබෙන සෑම සියළු දෙයක්ම හේතුවක් හා සහ සබදතාවන් තුලින් හටගන්නා තාවකාලික දේවල්ය. එම හේතුව හා සහ සබදතාවය නැති වන්නේ නම්, ඵලයක්ද නොමැති වේ. තවද වෙනස්ම ආකාරයේ හේතුවක් හා සහ සබදතාවක් එක් වන්නේ නම්, එයට සුදුසු ආකාරයේ ඵලයන්ද ලැබෙන්නේ' ලෙසින් යථාර්තය (හේතුඵල වාදය) පැහැදිලි කර දුන්හ. එම යථාර්තයට අනුකූලව 'පටිච්ච සමුප්පදය', 'චතුරාර්ය සත්‍යය', 'ආර්ය අෂ්ඨාංගික මාර්ගය', 'පාරමිතා' ආදියද දේශනා කළ වදූලහ. ඒ තුලින් විශාල පිරිසට ධර්මාවබෝධය සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

*මතු සම්බන්ධයි...*

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත

『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P156-P163



## Director’s Column

# උදසීන හදවතට පරාජය නොවී

ඔබ සියළුදෙනාම හොඳින් සිටිනවාද?

කොරෝනා වෛරසය මේ තරම් දුරට ලෝකය පුරා ව්‍යාප්ත වේවි යයි සිතුවේවත් නැහැ නේද?

දැඩි විශ්වාසයෙන් කටයුතු කරන්නේ නම්, සිතේ සැහැල්ලුවෙන් ජීවත් වීමට හැකිවේවි සේ පැවසුවත්, ටිකෙන් ටික කාලය දික් වෙනකොට කම්මැලි කමින් උදසීන බව ඇති වනවා සේම, නියමාකාරයෙන් පිලිපැදිය යුතුයි සේ සිතු දේවල් පවා ටිකක් මගහැරුනට කමක් නැහැ යන තත්වයට පත්වී තිබෙනවා.

මේ මාසයේ නිචිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩය තුලින් ‘උදසීම හදවතට පරාජය නොවී’ සේ සදහන් කර ඇති ආකාරයට, අරමුණක් ඇතිව කටයුතු කිරීම හා අන්‍යයන් ගැන සිතා කටයුතු කිරිමේ වැදගත්කම පෙන්වා දුන්නා.


අපිත් ඒ අනුව නික්යෝ නිවානෝ තුමා සංවිධානය ස්ථාපිත කිරිමේ අරමුණ වු ‘සෑම සියළු සත්වයෙකුම දුකින් මුදවා ගෙන, සාමකාමි ලොවක් බිහි කිරීම සදහා’ එකතුවී, සෑම දිනයක්ම වැදගත්කොට සලකා කටයුතු කරමු.

කෝයිචි සයිතෝ මහතා
ප්‍රධානී, අන්තර්ජාතික මුලස්ථානය, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org
URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**